7 වන පිටුවෙන් (ලයනල්ට)

ලියා යැවූ එම දීර්ඝ ලිපියේ අවධාරනය කල ප්‍රධාන කරුණ පක්ෂයේ නායකයන් වාහන පාවිච්චි කරනවිට අපගේ පුංචි සහෝදරවරුන් හා සහෝදරියන් ගම් නගරපුරා කැට හොල්ලමින් පක්ෂ අරමුදලට ශත පහ දහය එකතු කරන බවය. එවිට ඔව්හු සාමාන්‍ය ජනතාවගේ ප්‍රශ්න කිරීම් වලට විවේචනයට ලක්වන බවය. (එකල ජ.වි.පෙ. අද මෙන් මන්ත්‍රී වැටුප්, විදේශීය ආධාර නොවීය.

ලියුම පත්තු විය. මූලස්ථානය ගිනි ගත්තේය. දිස්ත්‍රික් කමිටු කැඳවිණ. වාද විවාද ඇතිවිය. රෝහණ සහෝදරයාගේ ශරීරාක්ෂාව කටයුතු කළ මාතර අමරේ සහෝදරයා (අමරදාස කුරුප්පු) කුපිත වී වැලිගමට ගොස් රෝහිතගේ දත් කැඩෙන්න පහර දී ආ යුතුයැයි යෝජනා කළේය. ප්‍රශ්නයට පිළිතුර පහරදීම නොව නිවැරදි පිළිතුරක් දීමයයි වෙනත් සහෝදරවරු පැවසූහ. අවසානයේ මාතර දිස්ත්‍රික්කයේ ආසන පහේම පක්ෂයේ ක්‍රියාකාරීන් කැඳවා කරුණු පැහැදිලි කර හඬා වැටුණු රෝහණ සහෝදරයා (ඔහු සමග අපිද හැඬුවෙමු) "රෝහිත සහෝදරයා අද ඉදලා පක්ෂයේ පූර්ණකාලීනයෙක් විදියට වැඩකරන්න බැහැ" යයි පැවසීය. (ලයියා මෙ කතාන්දරය දනියි. මා මෙය ලියුවේ ජ.වි.පෙ. සැගවුන ඉතිහාසයේ තවත් කතන්දරයක් කීමටය.) ඉහළ මට්ටමේ පුද්ගලයන්ගේ රහස් පහළ කමිටු වලින් හා සාමාජිකත්වයෙන් වසන් කරන ලදී. එහෙත් කෙසේ හෝ ඒවා පහළට කාන්දු විය. අප අපගේ කමිටු තුළ දිස්ත්‍රික් නායකයන්ගෙන් ඒවා විමසුකළ ඔවුන් කටේ පිට්ටු ලෙස ගොළුවත රැකිවාර අනන්ත විය. ඉන්පසුව අප ඒවා සාකච්ඡා කරන ලද්දේ අප අප අතරය. පක්ෂයේ අභ්‍යන්තර ඕපාදූප යයි මා සඳහන් කොට ඇත්තේ එයයි.

කරුණාකර 2009 ජූලි 26 දින ඉරිද ලක්බිම පත්‍රයේ කර්තෘ වාක්‍යය කියවන්න ලක්බිම ප්‍රධාන කර්තෘ සුන්දර නිහතමානී ද මැල් මහතා පකිස්ථාන අගමැතිවරයා අරභයා කියු කථාවකදී මෙසේ කියයි. (ලියයි)

"මේ කථාවේ වැදගත්ම කොටස වන්නේ මේ සිදුවීම පකිස්ථාන අගමැතිවරයා සිය දේශපාලන ප්‍රතිරූපය ඔප නංවා ගැනීමට හෝ පුවත්පත්වල "ඕපාදූප තීරුවලට" කථාවක් මැවීමට හෝ රඟ පෑ දේශපාලන නාට්‍යයක් නොවීමටය.

සුන්දර වැනි කෘතහස්ත පුවත්පත් කතුවරයෙකු පත්තර පළවන්නේ වැදගැම්මකට නැති ඕපාදූප යයි කියයි ද?

බෝපගේ සහෝදරය දැන්වත් ඉගෙන ගන්න. එය යෙදුමකි.

*මනු සම්බන්ධයි*

## Remembrance on 85th Birthday



Soma Karunathilake Piyasena
Born 2nd Sept 1924
Demise 8th March 1995

Remembered by Loving Husband, Children and Grandchildrean.




